**මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 - 2024**

---

**1. විගණන මතය**

**1.1** මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 23 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 23 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 2 ඡේදය අනුව උපචිත පදනමට ගිණුම් තැබිය යුතු වුව ද, ගොවිජන සේවා කාරක සභා 09 ක අක්කර බදු ආදායම සහ වාලවෙල ගොවිජන සේවා කාරක සභාවේ ස්ථාවර තැන්පත් පොලී ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදී ගිණුම් වාර්තා සකස් කිරීමේදී අක්කර බදු ආදායම් හා ස්ථාවර තැන්පත් පොලී ආදායම උපචිත පදනම මත ගිණුම්ගත කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබිය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07, දේපල පිරියත හා උපකරණ ප්‍රමිතයේ 86 ඡේදයේ (ඇ) වගන්තිය අනුව භාවිතා කළ ක්ෂය අනුපාතය දැක්විය යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 09 ක ක්ෂය අනුපාතය මෙන්ම ක්ෂය ප්‍රතිපත්තියද නිවැරදිව හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව ක්ෂය ප්‍රතිපත්ති හා ක්ෂය අනුපාතය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය. |
| (ඇ) | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 30(4) ඡේදයට පටහැනිව ගොවිජන සේවා කාරක සභා 05 ක ගොඩනැගිලි හීනවන ශේෂ ක්‍රමය මත ක්ෂය කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර නිවැරදිව ක්ෂය කිරීම් කළ යුතුය. |

### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක් මඟින් ගනුදෙනු ගිණුම්ගත කිරීමේ මෘදුකාංග, ගොවිජන බැංකු ගිණුම් මෘදුකාංග හා එම මෘදුකාංගයට අදාළ උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.319,183 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වී මාස 03 සිට 05 දක්වා කාලයක් ගතවන තෙක් එම වත්කම් කාරක සභා වෙත ලැබී නොතිබියදී එම වියදම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණු අතර රත්තොට හා හඳුන්ගමුව ගොවිජන සේවා කාරක සභා විසින් ලැබිය යුතු වත්කම් යටතේ එකතුව රු.34,262 ක ගොවිජන බැංකු මෘදුකාංග වටිනාකම් දක්වා නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස්ගෙන් උපදෙස් ලබා ගැනීමට කටයුතු කරන බව. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර අදාළ වත්කම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | කාරක සභා 03 ක එකතුව රු.133,220 ක් වූ ජංගම නොවන වත්කම් මිලදී ගැනීමට දරන ලද වියදම් සමාලෝචිත වර්ෂයට අදාළ වියදමක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල කළ යුතුය. |
| (ඇ) | අළුගොල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.14,570 ක් අඩුවෙන් සහ දඹුල්ල ගොවිජන සේවා කාරක සභාව විසින් වාර්ෂික ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.857,798 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණු අතර කාරක සභා 02 ක් විසින් එකතුව රු.401,657 ක් ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලී ආදායම මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතු අතර, ගිණුම්කරණ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය. |
| (ඇ) | කාරක සභා 07 ක් විසින් වටිනාකම රු.8,766,838 ක් වූ කල් ඉකුත් වූ තොග වර්ග 05 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ තොගය තුළ ඇතුළත් කර තිබුණි. | අපහරණය සඳහා යොමු කර ඇති බව. | තොග ශේෂය නිවැරදිව ගලපා මූල්‍ය ප්‍රකාශන සැකසිය යුතුය. |
| (ඉ) | ඇල්කඩුව හා පලාපත්වල ගොවිජන සේවා කාරක සභා විසින් ආදායම් අයිතම 02 කට අදාළව එකතුව රු.15,270 ක් මූල්‍ය හා කාර්යසාධන ප්‍රකාශයට අඩුවෙන් ගෙන තිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින් වියදම් අයිතම 03 කට අදාළව එකතුව රු.697,856 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපා නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | කාරක සභාවේ ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 03 ක ඉකුත් වර්ෂයට අදාළ රු.104,609 ක වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතු අතර ගිණුම්කරණ ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය. |
| (උ) | කාරක සභා 09 ක් විසින් එකතුව රු.18,734,122 ක් වූ ජංගම නොවන වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ හඳුනාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කරමින් මූල්‍ය ප්‍රකාශන අගයන් නිවැරදි කළ යුතුය. |
| (ඌ) | හත්තොටඅමුණ ගොවිජන සේවා කාරක සභාව විසින් ගොඩනැගිලි වටිනාකම රු.215,710 කින් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණු අතර සමුච්චිත ක්ෂය වටිනාකම රු.474,214 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීම් කළ යුතුය. |
| (එ) | කිඹිස්ස ගොවිජන සේවා කාරක සභාව විසින් කුඹුරු ඉඩම් ගොඩ කිරීමේ ගාස්තු ආදායම රු.174,800 ක් වැඩියෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඒ) | පලාපත්වල ගොවිජන සේවා කාරක සභාව විසින් මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 12 කින් ලැබිය යුතු කම්ටු ණය ලෙස රු.135,817 ක ශේෂයක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණද එම කාරක සභා ගිණුම් වාර්තාවල එවැනි ගෙවිය යුතු ශේෂයන් සඳහන්ව නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභා ගිණුම් වාර්තාවලට අදාළ තොරතුරු සම්බන්ධව කරුණු දැක්විය නොහැකි බව. | අදාළ කාරක සභා විමසා ශේෂ සනාථ කරවා ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගත යුතුය. |
| (ඔ) | තැන්න ගොවිජන සේවා කාරක සභාව විසින් ගොවිජන සේවා කාරක සභාව පිහිටි අක්කර 01 ක ප්‍රමාණයෙන් යුත් ඉඩම රු.3,000 ක් වූ ඓතිහාසික පිරිවැය මත ගිණුම්ගත කර තිබුණු අතර මෙම ඉඩම තක්සේරු කර නිවැරදි වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ඉඩම තක්සේරු කිරීමට දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා දී නොමැති බව. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පරිදි ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඕ) | වාලවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් රු.687,784 ක ලැබිය යුතු ලාභාංශ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කර නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය. |

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණයේ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 06 කට අදාළ වත්කම් විෂයයන් 04 ක, වගකීම් විෂයයන් 03 ක හා වියදම් විෂයයකට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ශේෂයන්, අනුරූපී වාර්තා සමඟ සැසඳීමේදී එකතුව රු.1,864,484 ක නොසැසඳීම් පැවතුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | ගිණුම් ශේෂ අනුරූපි වාර්තා සමඟ සසඳා නොසැසඳීම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ගොවිජන බැංකුවෙන් වාර්ෂිකව ලැබිය යුතු ලාභාංශ වටිනාකම, ගොවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන සමඟ සැසඳීමේදී එකතුව රු.699,788 ක නොසැසඳීම් පැවතුණි. | නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | ගෙවිජන බැංකු මූල්‍ය ප්‍රකාශන සමඟ සසඳා නොසැසඳීම් හඳුනාගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

### 1.3.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 12 ක මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති එකතුව රු.5,373,183 ක් වූ වත්කම් විෂයයන් 26 ක හා එකතුව රු.8,692,251 ක් වූ වගකීම් විෂයයන් 36 කට අදාළ උපලේඛන, ශේෂ සනාථ කිරීමේ ලේඛන හා ලිපිගොනු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් දැනුවත් කර ඇති බව. | ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සියලු තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | දේවහුව ගොවිජන සේවා කාරක සභාව විසින් එකතුව රු.771,988 ක් වූ විෂබීජ නාශක දියර සඳහා ලැබිය යුතු මුදල් සහ ලැබිය යුතු කෘෂිකර්ම අමාත්‍යාංශ පොහොර මුදල් සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අරමුදලට ගලපා තිබුණු අතර ඒ සඳහා අනුමැතිය ලද ලිපි විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | සමුච්චිත අරමුදලට ගැලපීමට කටයුතු කර ඇති අතර නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කිරීමට පදනම් වූ මූලාශ්‍ර ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභාව විසින් විකුණා මුදල් ගෙවීමේ පදනම යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් වෙත නිකුත් කළ ද්‍රව්‍ය හා මුදල් ලැබීම්, ලෙජරය තුලනය කර නොතිබීම නිසා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 05 | ලේඛන නිවැරදි ලෙස පවත්වා ගැනීමට කටයුතු කරන බව. | ලෙජර ගිණුම් නිවැරදිව තුලනය කර ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සියලු තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙනෙකුගේ ණයගැති ශේෂය රු.839,029 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදිව සත්‍යාපනය කළ නොහැකි විය. | | |
| (ඈ) | හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාව විසින් 2020 වර්ෂයට අදාළව කෘෂි ද්‍රව්‍ය තොග භාරකරුවෙකුගෙන් අයවිය යුතුව පවතින තොග ඌනතා වටිනාකම ලෙස රු.162,500 ක ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා තිබුණද මෙම ඌනතාවය තහවුරු කර ගැනීමට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කළ බවට තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | අදාළ මුදල ගෙවන ලෙස නිලධාරියා ලිඛිතව දැනුවත් කර ඇති බව. | ගිණුම් ශේෂ සම්බන්ධයෙන් සියලු තහවුරු කිරීම් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| | 15 (3) වගන්තිය හා 1998 මැයි 27 දිනැති අංක 322 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛය | යටවත්ත, කෝන්ගහවෙල සහ ගලේවෙල ගොවිජන සේවා කාරක සභා විසින් එකතුව රු.250,154 ක් වූ ඉඩම් හිමි ප්‍රවේණි මුදල් නිරවුල් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාරක සභා ගිණුම තුළ රඳවා ගෙන තිබුණු අතර යටවත්ත ගොවිජන සේවා කාරක සභාව විසින් එකතුව රු.33,441 ක් වූ අඳහිමි ප්‍රවේණි මුදල් අදාළ පාර්ශව වෙත ගෙවීමෙන් තොරව කාරක සභා ගිණුමේ රඳවාගෙන තිබුණි. | ගොවීන් දැනුවත් කළ බවත් ඔවුන් ඉදිරිපත් නොවන්නේ නම් ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් පරිදි ඉදිරියේදී ගොවීන්ගේ භාරකාර අරමුදලට බැර කිරීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන අනුව කටයුතු කර ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. | මුදල් රෙගුලාසි 110 | ගොවිජන සේවා කාරක සභා 10 ක් මගින් හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | ඉදිරියේදී හානි පාඩු ලේඛනයක් පවත්වා ගෙන යන බව. | ලේඛන පවත්වා නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ලේඛන |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| ii. | මුදල් රෙගුලාසි 237 (ආ) | සිදු කළ නියැදි පරීක්ෂාව අනුව ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභාව මඟින් අවස්ථා 12 කදී රු.2,258,979 ක් වටිනා මිලදී ගැනීම් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව වවුචර් සමඟ ඉදිරිපත් කළ යුතු අනෙකුත් ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ ලේඛන, තොග පොත් හා අදාළ අඩුපාඩු සමඟ නිවැරදි කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ගෙවීම් වවුචර් සමඟ අනෙකුත් ආධාරක ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| iii. | මුදල් රෙගුලාසි 264 (1) | සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් දල මුදල ලැබුණු බවට ආදායකයා විසින් තහවුරු කළ යුතු වුවත් හත්තොටඅමුණ ගොවිජන සේවා කාරක සභාව විසින් එකතුව රු.372,300 ක වටිනාකමින් යුතු වවුචර් 04 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ආදායකයා විසින් තහවුරු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ තහවුරු කිරීම් ලබාගත යුතුය. |
| iv. | මු.රෙ. 315 | ගොවිජන සේවා කාරක සභා 05 ක් මඟින් මාර්ගස්ථ මුදල් පිළිබඳව රක්ෂණාවරණයක් ලබා ගෙන නොතිබුණි. | ඉදිරියේදී මාර්ගස්ථ මුදල් රක්ෂණාවරණයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර මාර්ගස්ථ මුදල් සඳහා රක්ෂණ ආවරණයක් ගත යුතුය. |
| v. | මුදල් රෙගුලාසි 316 | රජයේ සියලුම මුදල් සේප්පුවක, ආරක්ෂිත පෙට්ටියක හෝ ආරක්ෂිත කාමරයක් වැනි ආරක්ෂාව සහිත ස්ථානයක තැබිය යුතු වුවත් හත්තොටඅමුණ ගොවිජන සේවා කාරක සභාව සතුව එවැනි ආරක්ෂිත සේප්පුවක් නොතිබුණි. | ආරක්ෂිත සේප්පුවක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ආරක්ෂක විධිවිධාන සලසා ගැනීමට කටයුතු කළ යුතුය. |
| vi. | මුදල් රෙගුලාසි 502 (2) හා 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 05 ක ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | අදාළ ලේඛන පවත්වා නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර එම ලේඛන පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| vii. | මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව සහ ගොවිජන සංවර්ධන | මුදල් හා තොග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා බලය ලබාදී ඇති නිලධාරීන් විසින් ඇප තැබිය යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා | නිලධාරින් දැනුවත් කර ඇප තැබීමට ඉදිරියේදී කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර කඩිනමින් ඇප තැබීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | කොමසාරිස් ජනරාල්ගේ 2020 ජුනි 25 දිනැති අංක 8/2020 දරන චක්‍රලේඛය | 06 ක නිලධාරින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| viii. | මුදල් රෙගුලාසි 890 (i) | ගොවිජන සේවා කාරක සභා 04 ක ඇප තැන්පත් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පත් ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර අදාළ ලේඛන පවත්වා ගත යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය | රජයට අවම අවාසියක් වන පරිදි ආයතනය සුදුසු ප්‍රසම්පාදන ක්‍රමයක් අනුගමනය කරමින් මිලදී ගැනීම් සිදු කළ යුතු වුවත්, උකුවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් මිල කැඳවීමකින් තොරව පොහොර, කෘෂි රසායන හා කෘෂි උපකරණ මිලදී ගෙන තිබුණි. තවද ජල ටැංකි, බිත්තර වී, ආරක්ෂිත විදුලි වැට සඳහා සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණද අනෙකුත් මිලදී ගැනීම් සඳහා එලෙස සැපයුම්කරුවන්ද ලියාපදිංචි කර නොතිබුණි. | නිවැරදිව අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඈ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 16 ක නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමට සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කර නොතිබුණු අතර ගොවිජන සේවා කාරක සභා 17 ක පැමිණීම හා පිටවීම පරීක්ෂා කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයෙන් මුද්‍රිත පිටපත් ලබා ගෙන නොතිබුණි. | ඇඟිලි සලකුණු යන්ත්‍රය නිසි ක්‍රියාකාරිත්වයේ නොමැති බැවින් අලුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇති බවත් මුද්‍රිත පිටපත් ලබා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු නොකළ පාර්ශව වෙත විධිමත් පියවර ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කොමසාරිස් චක්‍රලේඛ | | | |
| i. | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 17 වගන්තිය 3 (අ) ඡේදය | අළුගොල්ල සහ ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභා මඟින් ගොවිජන සේවා කාරක සභාවේ සභාපතිගේ අනුමැතිය නොමැතිව අවස්ථා 22 කදී වටිනාකම රු.247,179 ක් වූ ගෙවීම් සිදු කර තිබුණි. | ඉදිරියේදී අතපසුවීම් සිදු නොවන ලෙස කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර ඊට පටහැනිව කටයුතු කළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| ii. | 1981 ඔක්තෝබර් 16 දිනැති අංක 107 දරන චක්‍රලේඛයේ 21 (2) ඡේදය | තොග ලේඛනය අවම වශයෙන් සති දෙකකට වරක්වත් විධායක ලේකම්වරයා මඟින් පරීක්ෂා කර ශේෂ නිවැරදි බවට අත්සන් කළ යුතු වුවද පල්ලේපොල ගොවිජන සේවා | ඉදිරියේදී තොග පොත් පරීක්ෂා කර අත්සන් කරන බව. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| | | කාරක සභාව මඟින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| iii. | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | ගොවිජන සේවා කාරක සභා 03 ක් මඟින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.104,689 ක කාමර කුලී අයකර නොතිබුණි. | ආයතනය දැනුවත් කර ඇති අතර ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර කාලීනව කුලිය අය නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| iv. | 2000 ජූනි 06 දිනැති අංක 518/2000 දරන චක්‍රලේඛයේ 03 ඡේදය හා 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති චක්‍රලේඛයේ 5.6 (i) ඡේදය අනුව | 2024 වර්ෂයේ ගොවිජන බැංකු 23 හි මූල්‍ය ප්‍රකාශන ගොවිජන සේවා කාරක සභාවල මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස්වලට අනුව ගිණුම් වාර්තාව සකස් කර ඇති බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් කඩිනමින් උපදෙස් ලබාගෙන චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| v. | 2011 පෙබරවාරි 01 දිනැති අංක 7/5/1 දරන චක්‍රලේඛයේ 05 ඡේදය | උප පත්‍රිකා පොත් නැවත නිකුත් කළ යුත්තේ මුලින් භාරදුන් පොත් ආපසු භාර ගැනීමෙන් පසුව වුවද, ගොවිජන සේවා කාරක සභා 05 කට අදාළව නිලධාරීන් 17 දෙනෙකු සඳහා එකම වසමකට අදාළව පෙර නිකුත් කරන ලද අක්කර බදු කුවිතාන්සි පොත් නැවත භාර ගැනීමකින් තොරව නැවත නිකුත් කර තිබුණි. | කඩිනමින් නැවත උප පත්‍රිකා පොත් භාර ගැනීමට කටයුතු කරන බව. | විධිමත් පරීක්ෂණයක් සිදු කර අවධිමත් පරිදි කටයුතු කළ නිලධාරීන්ට පියවර ගැනීමටත්, චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර මූල්‍ය අවභාවිතා වීම වැළැක්වීම සඳහා කටයුතු කිරීමත් කළ යුතුය. |
| vi. | 2013 මාර්තු 08 දිනැති අංක 04/2013 දරන චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 04 ක ගොවිජන සේවා මධ්‍යස්ථාන පරිශ්‍රය උපයෝගී කර ගනිමින් ගොවි නිෂ්පාදන අලෙවිය, තාවකාලික ආපනශාලා පැවැත්වීම හා ගොවි සංවිධානවල කෘෂි නිෂ්පාදන ගොවිජන සේවා මධ්‍යස්ථානයේ අලෙවි කිරීම් වැනි කටයුතු සිදු කර නොතිබුණි. | ප්‍රතිපාදන ලද පසු අලෙවිසැල් ඉදිකිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| vii. | 2016 පෙබරවාරි 09 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු විසින් අවම වශයෙන් මාස 04 කට වරක්වත් ගොවි සංවිධාන පරීක්ෂා කර ගොවි සංවිධාන පරීක්ෂණ වාර්තාවක් ප්‍රාදේශීය ගොවිජන සංවර්ධන නිලධාරී වෙත | අඩුපාඩු සකස් කර ගන්නා බවත් ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවන ලෙස කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට විධිමත් |

| | | | | |
|---|---|---|---|---|
| | | ඉදිරිපත් කළ යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 04 කට අදාළව එලෙස කටයුතු කර නොතිබුණි. | | පියවර ගත යුතුය. |
| viii. | 2022 දෙසැම්බර් 21 දිනැති අංක 7/5/3 වි/මු/ගෙ චක්‍රලේඛයේ 04 (II) ඡේදය | ගොවිජන සේවා කාරක සභා 04 ක් මඟින් විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘෂි ද්‍රව්‍ය ණයට ලබාදී එම ණය මුදල් මාස 06 ක කාලයක් තුළ අයකර ගත යුතු වුවද වටිනාකම රු.456,940 ක් වූ ණය ශේෂය 2025 මැයි 30 දින වන විටත් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර කාලීනව මුදල් අයකර නොමැති නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය. |
| ix. | 2022 දෙසැම්බර් 28 දිනැති අංක 04/2012 (සංශෝධන vii) චක්‍රලේඛය | ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියක තබා ගත යුතු අත ඉතිරි මුදලේ උපරිම සීමාව රු.50,000 ක් වුවද වාලවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් අවස්ථා 42 කදී රු.54,650 ක සිට රු.110,253 ක පරාසයක් දක්වා මුදල් අත රඳවා ගෙන තිබුණ අතර දේවහුව හා හත්තොටඅමුණ ගොවිජන සේවා කාරක සභා බැංකුවල අවස්ථා 24 කදී රු.52,299 සිට රු.184,271 ක් දක්වා අත රඳවාගෙන තිබුණි. | ප.ව. 3.00 න් පසුව බැංකු ගනුදෙනු සිදු වන බවත් පසු දින මුදල් බැංකුගත කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර අදාළ අධීක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය දැඩි කළ යුතුය. |
| x. | 2023 අප්‍රේල් 24 දිනැති අංක 01/2023 දරන චක්‍රලේඛයේ 07 ඡේදය | සෑම කාර්තුවක් අවසානයේදීම ආපදා ණය ආවරණ ගිණුමේ රැස් වූ මුදල් ආපදා අරමුදල් ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කළ යුතු වුවද පල්ලේපොල සහ වේරගම ගොවිජන බැංකු විසින් 2024 වර්ෂයේ එක් වරක් පමණක් ස්ථාවර තැන්පත් ගිණුමක් විවෘත කර තිබුණු අතර ආපදා අරමුදලේ ඉතුරුම් ගිණුමේ ශේෂය රු.196,649 ක්ව පැවතුණි. | සෑම කාර්තුවක් අවසානයේදීම ස්ථාවර තැන්පත් ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර එසේ නොකල නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය. |
| xi. | 2023 අප්‍රේල් 26 දිනැති අංක 7/5/9/05 දරන චක්‍රලේඛයේ (මෙහෙ.පො) I වෙළුමේ (2) (i) ඡේදය | ගොවිජන සේවා කාරක සභා 13 ක් විසින් සුළු මුදල් ක්‍රමවේදය ක්‍රියාත්මක කර නොතිබුණි. | සුළු මුදල් ක්‍රමවේදය ඉදිරියේදී ක්‍රියාත්මක කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය. |
| xii. | 2023 දෙසැම්බර් 11 දිනැති අංක 12/2018 (සංශෝධන I) දරන චක්‍රලේඛයේ | ගොවිජන සේවා කාරක සභා/ ගොවිජන බැංකු ගිණුම්වලින් මුදල් ආපසු ගැනීමේදී හා නැවත විකිණීමේ පදනම මත කම්ටුව වෙත මිලදී ගන්නා ද්‍රව්‍ය සඳහා ගෙවීම් කිරීම් | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු නොවන ලෙස කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු අතර එසේ නොකළ නිලධාරීන්ට විධිමත් |

| | | |
|---|---|---|
| 02 (i) ඡේදය | සීමාව රු 200,000 ඉක්මවන විට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/ සහකාර කොමසාරිස්වරු විසින් චෙක්පත් අනු අත්සන් තැබිය යුතු බව, සඳහන්ව තිබුණද වාසලකෝට්ටේ ගොවිජන සේවා කාරක සභාවෙන් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 02 කදී රු.472,000 ක් ගෙවීම සඳහා සහකාර කොමසාරිස් අනු අත්සන් ලබා ගෙන නොතිබුණි. | පියවර ගත යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 17 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.17,351,924 ක අතිරික්තයක් හා කාරක සභා 06 ක මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු.1,713,446 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූප කාරක සභා 19 ක ඉකුත් වර්ෂයේ රු.23,298,179 ක අතිරික්තයක්ද කාරක සභා 04 ක රු.725,470 ක ඌනතාවයක්ද විය. ඒ අනුව කාරක සභා 12 ක අදාළ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,450,096 ක වර්ධනයක් ද කාරක සභා 11 කට අදාළව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,820,871 ක පිරිහීමක්ද නිරීක්ෂණය විය. මෙම වර්ධනයන්ට අක්කර බදු ආදායම සහ සේවා සැපයුම් ආදායම වර්ධනය වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 11 කට අදාළව 2023 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව එකතුව රු.344,120 ක හිඟ විගණන ගාස්තු ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී ගෙවා අවසන් කරන බව. | කඩිනම් පියවර ගෙන ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 10 කට අදාළව දිගු කලක සිට පැවත එන එකතුව රු.7,564,976 ක ලැබිය යුතු ගිණුම් ශේෂ 40 ක් හා රු.32,153,612 ක ගෙවිය යුතු ගිණුම් ශේෂ 65 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කරගත යුතු අතර ඒවා කාලීනව නිරවුල් නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය . |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 කට අයත් ඉඩම් පවරා ගැනීමට කර නොතිබුණි. | ගොවිජන සේවා කාරක සභාවට අයත් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ඉඩම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | දේවහුව ගොවිජන සේවා කාරක සභා ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.1,226,812 ක් සහ විගණිත දිනයේදී එම මුදල රු.1,264,190 ක් වූ අතර මෙම මුදල් වැඩි ප්‍රතිලාභයක් ලබාගත හැකි වන පරිදි විධිමත් අනුමැතියක් යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂයේ සිට පවතින ගෙවිය යුතු ශේෂයන්ට අදාළ මුදලක් බව. | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන අතිරික්ත මුදල් විධිමත් අනුමැතිය යටතේ ස්ථාවර තැන්පතුවක ආයෝජනය කළ යුතුය. |
| (ඉ) | ගලේවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් 2025 පෙබරවාරි 19 දිනට ලෝක ආහාර වැඩසටහන යටතේ ගොවිජන සේවා කාරක සභාව වෙත ලද MOP සහනාධාර පොහොර කිලෝග්‍රෑම් 17179 ක් සමාලෝචිත වර්ෂය අවසානයටත් භෞතිකව පැවතුණු අතර ගොවිජන සේවා බල ප්‍රදේශයට අවශ්‍ය වන පොහොර ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් වීමකින් තොරව මෙම පොහොර ලබා ගැනීම හේතුවෙන් විශාල පොහොර ප්‍රමාණයක් භාවිතයකින් තොරව ගබඩාවේ රඳවා තබා ගෙන තිබුණි. | අදහස් දක්වා නොමැත. | වගා කරන භූමි ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන පොහොර ලබාගත යුතු අතර විධිමත් වැඩපිළිවෙලක් යටතේ මෙම පොහොර භාවිතයට ගත යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 05 ක එකතු වටිනාකම රු.854,561 ක් වූ යූරියා කිලෝග්‍රෑම් 1960 ක් කොම්පෝස්ට් කිලෝග්‍රෑම් 1691 ක් කෘෂි රසායන තොගයක් හා බීජ පැකට් 305 ක් ද ගොවිජන සේවා කාරක සභා 03 ක නොමිලේ බෙදාහැරීම සඳහා ලබාදී තිබූ MOP පොහොර කිලෝග්‍රෑම් 250 ක් හා TSP පොහොර කිලෝග්‍රෑම් 818 ක් කල් ඉකුත් වී තිබුණි. | බීජ පැකට් අදාළ ආයතනයට හරගන්නා ලෙස දන්වා ඇති බව හා සහනාධාර පොහොර ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් ලබාගෙන ඉදිරි කටයුතු කරන බව. | නිවැරදිව තොග අවශ්‍යතාවයන් හඳුනාගෙන තොග කළමනාකරණය කළ යුතු අතර තොග සම්බන්ධයෙන් විධිමත් පරිදි කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (උ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාව විසින් ඉකුත් වර්ෂයේ මිලදී ගෙන තිබූ බඩඉරිඟු පොහොර කිලෝග්‍රෑම් 1790 න් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පොහොර කිලෝග්‍රෑම් 50 ක් පමණක් අලෙවි වී තිබුණි. | මෙම පොහොර අලෙවි කිරීමට නොහැකි බැවින් නියෝජ්‍ය කොමසාරිස්ගෙන් ලිඛිතව උපදෙස් ඉල්ලා ඇති බව. | තොග අවශ්‍යතාවයන් නිවැරදිව කළමනාකරණය කළ යුතු අතර විධිමත් වැඩපිළිවෙලක් යොදා පොහොර තොග අලෙවි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | කෝන්ගහවෙල සහ ලග්ගල පල්ලේගම ගොවිජන සේවා කාරක සභාවල සමාලෝචිත වර්ෂයේ සහනාධාර පොහොර අලෙවිය රු.2,597,147 ක් ද ඇතුළුව මුළු මුදල් රු.2,65,947 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ට ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය වෙත යැවීමට කටයුතු කරන බව. | සහනාධාර පොහොර මුදල් නියෝජ්‍ය කොමාසාරිස් වෙත යැවීමට කටයුතු කළ යුතු අකර එසේ නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය |
| (එ) | පලාපත්වල ගොවිජන සේවා කාරක සභාව සතු වර්ග 03 ක අයිතම 29 ක වටිනාකම රු.451,800 ක් වූ භාණ්ඩ ඉකුත් වර්ෂයේ සිට අලෙවි නොවී ගබඩාවේ ඉතිරි වී පැවතුණු අතර කාරක සභාව විසින් ප්‍රමාණවත් පරිදි තොග කළමනාකරණය කර නොතිබුණි. | ගොවීන්ගේ අවශ්‍යතාවය මත මිලදී ගෙන ඇති අතර මේ වන විටත් අලෙවි වන බව. | තොග අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන කළමනාකරණය කළ යුතු අතර කඩිනම් වැඩපිළිවෙලක් යොදා භාණ්ඩ අලෙවි කළ යුතුය. |
| (ඒ) | වාලවෙල හා වේරගම ගොවිජන සේවා කාරක සභාවල පවුල් 328 ක් ප්‍රතිලාභ ලබන කුඹුරු අක්කර 178 ක් ආවරණය වන සුළු වාරිමාර්ග 16 ක් ප්‍රතිසංස්කරණය කළ යුතු බව හඳුනාගෙන තිබුණද එලෙස කටයුතු කර නොතිබුණි. | වේරගම ගොවිජන සේවා කාරක සභාවේ සුළු වාරිමාර්ග 03 ක් සඳහා ප්‍රතිපාපදන ලද අතර වාලවෙල ගොවිජන සේවා කාරක සභාවේ 2025 වර්ෂයේ ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කරන බව. | විධිමත් සැලැස්මක් යටතේ ප්‍රතිපාදන ලබා ගෙන වාරිමාර්ග නිසි පරිදි නඩත්තු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාවේ සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 14 දින ස්කැනර් හා DOT මෙට්‍රික්ස් ප්‍රින්ටර් මිලදී ගැනීමට රු.98,677 ක් වැයකර තිබුණ අතර 2025 අප්‍රේල් 28 දින වන විටත් ස්කැනර් යන්ත්‍රය භාවිතයට ගෙන නොතිබුණි. | මෘදුකාංගය ලද පසු භාවිතා කිරීමට කටයුතු කරන බව. | නිෂ්කාර්ය වත්කම් උපයෝජනය කළ යුතු අතර අවශ්‍යතාවය අනුව පමණක් භාණ්ඩ මිලදී ගැනීම කළ යුතුය. |
| (ආ) | හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභාව සතු අලෙවිසැල 2019 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රමාණවත් නිලධාරින් නොමැති බැවින් විවෘත කර පවත්වා ගෙන යා නොහැකි බව. | නිෂ්කාර්ය වත්කම් උපයෝජනය කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

## 4. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට ගොවිජන සේවා කාරක සභා 12 ක සාමාන්‍ය තැන්පත් ගිණුම්, පෙරමග තැන්පත්, කුඩා කණ්ඩායම්, ගොවි සංවිධාන හා කාන්තා ගොවි සංවිධාන ගිණුම් පිළිවෙලින් 25880 ක් 2785 ක් 208 ක් 81 ක් හා 141 ක් පැවති අතර පිළිවෙලින් ඉන් ගිණුම් 10760 ක් 1180 ක් 82 ක් 22 ක් හා 41 ක් ආරම්භක තැන්පත් මුදලට පමණක් සීමා වී තිබුණි. | වසම් මට්ටමින් ගිණුම් හිමියන් හඳුනාගෙන ගිණුම් සක්‍රිය කිරීමට කටයුතු කළ යුතුය. | ඉතුරුම් වර්ධනය කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් වසම්වල නිලධාරීන්ගේ ක්‍රියාකාරීත්වය වැඩි කිරීමට ක්‍රමවේදයක් සැකසිය යුතුය. |
| (ආ) | ගොවි ජනතාවගේ මූල්‍ය ශක්තිය වර්ධනය කිරීමට අදාළව ණය දීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගොවිජන බැංකු 10 ක කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි වසම් 244 ක් අතරින් වසම් 96 ක් සඳහා කිසිදු වගා ණයක් නිකුත් කර නොතිබුණි. | ණය නිකුත් නොකළ වසම් සඳහා ද ණය නිකුත් කිරීමට සටහන් කර ගත් බව. | ආර්ථික ප්‍රතිලාභ ගොවි ජනතාවට ලබා දීමේ අරමුණින් ණයදීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගොවිජන බැංකු මෘදුකාංගය මිලදී ගැනීම සඳහා ගොවිජන සේවා කාරක සභා 10 ක් විසින් ඉකුත් වර්ෂයේ රු.3,075,411 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම මෘදුකාංගය ස්ථාපිත කර නොතිබීම නිසා Dot Matrix Pass Book ප්‍රින්ටර් 12 ක් Scanner 12 ක් Dot Matrix ප්‍රින්ටර් 07 ක් Desktop පරිගණකයක් හා ප්‍රින්ටර් 05 ක් නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රධාන කාර්යාලය විසින් මෘදුකාංගයක් සකස් කිරීමේ අරමුණින් උපකරණ මිලදී ගැනීමට උපදෙස් දුන්නද මේ වන තෙක් මෘදුකාංගය හඳුන්වා දී නොමැති බව. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය වී මෘදුකාංගය ස්ථාපිත කිරීමට කටයුතු කඩිනම් කරගත යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 07 ක ආපදා ඉතිරි කිරීමේ ගිණුමට ලද පොලී රු.18,038 ක් ද ආපදා ස්ථාවර තැන්පත් සඳහා ලද පොලී රු.346,562 ක් වූ මුළු එකතුව රු.364,600 ක් ආපදා අරමුදලට බැර කර නොතිබුණ අතර, ක්ෂුද්‍ර මූල්‍ය ස්ථාවර තැන්පත් සඳහා ලද රු.455,184 ක් හා ක්ෂුද්‍ර මූල්‍ය ඉතිරි කිරීමේ ගිණුමට ලද පොලී රු.1,880 ක් ද ලෙස එකතුව රු.457,064 ක් ක්ෂුද්‍ර මූල්‍ය අරමුදලට බැර කිරීමකින් තොරව එම සියලුම ලැබීම් ගොවිජන බැංකුවේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. | විධිමත් පරිදි කටයුතු කර අදාළ ලැබීම් නිවැරදි ගිණුම් තුළට බැර කළ යුතුය. |
| (ඉ) | 1999 වර්ෂයේ සිට 2024 දක්වා ගොවිජන සේවා කාරක සභා 20 ක පුද්ගලයන් 2022 දෙනෙකු | අවසන් නියෝග, විනිශ්චය සභා හා අධිකරණ වෙත යොමු | විධිමත් පරීක්ෂණයක් පවත්වා ණය ලබා දීමට |

| | | | |
|---|---|---|---|
| | වෙත නිකුත් කරන ලද වර්ග 05 ක හිඟ ණය මුදල් රු.95,992,057 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර පුද්ගලයන් 239 දෙනෙකුට නිකුත් කළ රු.13,811,158 ක මෙම ණය මුදලින් එක් වාරිකයක් හෝ අයකර ගෙන නොතිබුණි. | කර ණය අයකර ගැනීමට කටයුතු කරන බව. | කටයුතු කළ හා හිඟ ණය අය කිරීමට කටයුතු නොකළ නිලධාරීන්ට විධිමත් පියවර ගත යුතුය. |
| (ඊ) | දඹුල්ල ගොවිජන සේවා කාරක සභාවෙන් ලංකා ඇණු සමාගමක් වෙත 2001 වර්ෂයේදී ලබා දී තිබූ රු.1,000,000 ක ණය මුදලින් කිසිදු වාරිකයක් අයකර ගෙන නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට අයකර ගත යුතු පොලිය රු.1,743,698 ක්ව පැවතුණි. | විනිශ්චය සහා පරීක්ෂණ කටයුතු සිදු වෙමින් පවතින බව. | විධිමත් පියවර ගෙන අදාළ ණය ශේෂ අයකර ගැනීමටත්, ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වා ගැනීමත් කළ යුතුය. |
| (උ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2024 සැප්තැම්බර් 19 දිනැති අංක 7/12/4/1 දරන ලිපියේ 2.1.1 ඡේදය පරිදි 2024 ඔක්තෝබර් 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වූ ගිණුම් හිමියන්ගේ පෙරමඟ ළමා ඉතුරුම් ගිණුම් පිළිබඳ අවශ්‍ය දැනුවත් කිරීම් කර සාමාන්‍ය තැන්පත් ගිණුම් ලෙස පරිවර්තනය කළ යුතු වුවත් පල්ලේපොල, කිඹිස්ස හා හෙට්ටිපොල ගොවිජන සේවා කාරක සභා බැංකුවල තැන්පත්කරුවන් 73 දෙනෙකුගේ පෙරමඟ ළමා ඉතුරුම් ගිණුම් සාමාන්‍ය තැන්පත් ගිණුම් ලෙස පරිවර්තනය කර නොතිබුණි. | වයස අවුරුදු 18 ඉක්ම වූ තැන්පත්කරුවන්ගේ පෙරමඟ ළමා තැන්පත් සාමාන්‍ය තැන්පත් බවට පරිවර්තනය කිරීමට කඩිනමින් කටයුතු කරන බව. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කර ගිණුම් පරිවර්තන කඩිනමින් කළ යුතු අතර ඒවා සිදු නොකළ නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ඌ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ හිටපු කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියකු සිදු කළ මූල්‍ය අක්‍රමිකතාවක් සම්බන්ධයෙන් සිදු කළ පරීක්ෂණයකින් පසුව 2019 වර්ෂයේදී රු.778,310 ක් අයකිරීමට තීරණය කර, එම වර්ෂයේ සිට 2022 දක්වා කාලය තුළ රු.345,000 ක මුදලක් අයකර කිසිදු හේතු දැක්වීමකින් තොරව රු.433,310 ක මුදල අයකිරීම අත්හිටුවා තිබුණි. | නියෝජ්‍ය කොමසාරිස් වෙත මෙ සම්බන්ධයෙන් තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | පරීක්ෂණයේ නිර්දේශ මත අදාළ අය කිරීම් කළ යුතු බවත් අයකිරීම් නතර කළ පාර්ශව සම්බන්ධයෙන් පියවර ගැනීමත් කළ යුතුය. |
| (එ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ 2000 වර්ෂයේ සිට 2006 වර්ෂයන්වලදී ගොවිජන බැංකුව විසින් ණය ලබාදීමේදී එක් කන්නයක හිඟ ණය තිබියදී ඊට පසු කන්නය සඳහාද එකම ගොවියා වෙත ණය නිකුත් කළ අවස්ථාද පැවති අතර හිඟ ණය පවතින එවැනි ගොවීන් 09 දෙනෙකුගෙන් රු.126,479 ක් වූ හිඟ ණය මුදලක් හා රු.130,526 ක් වූ හිඟ ණය පොලියක් ලෙස එකතුව රු.257,005 ක් ණය අය කර ගැනීමට පැවතුණි. | වසම්භාර නිලධාරීන් හා ගොවිජන බැංකු කාර්ය මණ්ඩලය දැනුවත් කර ලෙජර් නිසි පරිදි පරීක්ෂා කර ණය ගෙවා තිබේද යන්න තහවුරු කරගෙන ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බව. | අවධිමත් පරිදි ණය ලබාදීම හා කාලීනව හිඟ ණය අය කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගැනීමටත් ණය ශේෂ අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ 2000 වර්ෂයේ සිට 2006 කාල සීමාව තුළ ණය නිකුත් කරන ලද ගිිවිසුම් පත්‍ර පරීක්ෂා කිරීමේදී ඉන් 12 ක ණය මුදල සඳහන් කර නොතිබුණු අතර ගිවිසුම් පත්‍ර 04 ක් ගොවිජන සේවා කාරක සභා විධායක ලේකම් අත්සන් කර නොතිබුණි. මෙලෙස අසම්පූර්ණ ගිවිසුම්වලට අදාළව ගොවීන් 07 දෙනෙකු සම්බන්ධයෙන් රු.76,940 ක් වූ ණය මුදලක් හා රු.77,613 ක් වූ පොලී මුදලක් ලෙස එකතුව රු.154,553 ක් අයකර ගැනීමට පැවතුණි. | නිශ්චිත පිළිතුරක් ලබාදී නොමැත. | - එම - |
| (ඔ) | කෝන්ගහවෙල ගොවිජන සේවා කාරක සභාවේ 2023 මැයි මස 07 වන දින කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු භාරගත් කුවිතාන්සි පොත මේ වන තෙක් ගොවිජන සේවා කාරක සභාවට ආපසු භාරදී නොමැති බවට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්ගේ 2024 නොවැම්බර් 18 දිනැති හා අංක 5/5/3/1/11 දරන ලිපිය මඟින් එම නිලධාරියා දැනුවත් කර තිබුණි. එමෙන්ම බිල්පතක් ගොවි මහතෙකු විසින් විනිශ්චය සභාවට ඉදිරිපත් කිරීම හේතුවෙන් මෙම ගොවි බැංකුවට අදාළව මුදල් එකතු කරන ලද බිල් පොතක්ද අස්ථානගත වී ඇති බව තවදුරටත් තහවුරු වී ඇති අතර අදාළ කාලය තුළ සේවයේ නියුතුව සිටි නිලධාරියා සම්බන්ධයෙන් පැවැත්වෙන විමර්ශන 2025 මැයි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. | නියෝජ්‍ය කොමසාරිස් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | විමර්ශනය කඩිනමින් අවසන් කර වගකිව යුතු පාර්ශව වෙත පියවර ගත යුතුය. |